**පුත්තලම නගර සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 2. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**------------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පුත්තලම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**-----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.231,962 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් බදු රු.24,999 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ මාර්ග 04 ක් සංවර්ධනය කිරීමට 2017 වර්ෂයේදී ලැබී තිබුණු රු.3,366,011 ක් ණයගැති ගිණුම බැර කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදිත රු.679,050 ක් වූ කොම්පෝස්ට් පොහොර තොගයද, විකුණුම් ආදායම්ද ප්‍රාග්ධන ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු වරිපනම් බදු රු.1,334,313ක් කලින් ලද ලැබීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) වටිනාකම රු.1,095,695 ක්වූ සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු ස්ථාවර වත්කම් විෂයයන් 04 ක වටිනාකම රු.73,400 ක් ප්‍රාග්ධනගත කර නොතිබුණි.

(ඍ) 2016 වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු රු.350,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) 2015 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු කෘෂි කැබ්රථයේ වටිනාකම රු.3,223,220 ක් සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට හා සැපයුම් ණයහිමියන්ට දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ රු.288,672 ක විශ්‍රාම වැටුප් වෙන්කිරීම් සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

(ඔ) සභාවට අයත් කඩ කාමරයක් බදුදීම වෙනුවෙන් ලැබී තිබුණු රු.350,000 ක පෙර ගෙවුම් මුදල සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.

(ඕ) පරිත්‍යාග ලෙස 2014 වර්ෂයේදී ලැබී තිබුණු රෝද හතරේ ට්‍රැක්ටරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග ලෙස ලැබූ යන්ත්‍ර හා උපකරණවල වටිනාකම් ගණනය කර ගිණුම්වල දක්වා නොතිබුණි.

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය ශේෂය හා උපලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු.289,958ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.92,859,282 ක් වූ ස්ථාවර වත්කම් හා රු.61,179,064 ක් වූ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර, රු.31,680,218 ක වෙනසක් පැවතුණි.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

-----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.254,999,174 ක් වූ ලැබියයුතු ශේෂ වලින් රු.168,622,810 ක් වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබූ අතර, එයින් රු.18,580,150 ක් හඳුනා නොගත් අත්තිකාරම් ලෙස පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.108,608,450 ක් වූ ගෙවිය යුතු ශේෂවලින් රු.83,660,640 ක් වර්ෂ 03 ක කාල සීමාවක් ඉක්මවා තිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.267,196,598 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීතී,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම**

නීතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතී,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට වලට යොමුව | වටිනාකම | අනුකුල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) නගර සභා ආඥා පනත (255 වන අධිකාරය) | | |
| (i) 33 වගන්තිය | | සභාව සතු දේපළවල අයිතිය තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් නොකෙරුණි. |
| (ii) 178(1)(2) වගන්තිය | | සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් අයවැය ලේඛනයක් පමණක් ඉදිරිපත් කර තිබුණි. |
| (iii) 181(1) වගන්තිය | 44,040,433 | සභාව විසින් 1999 වර්ෂයේ සිට විගණන ගාස්තු ගෙවා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මු.රෙ. 565(3)(4)හා(5) | 50,758,520 | ඉකුත් වර්ෂවල තැන්පතු ලෙජර් ශේෂ ඉදිරියට ගෙනවිත් නොතිබුණු අතර, පොදු 71 ආකෘතියේ මාසික තැන්පතු සාරාංශ පිළියෙල කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 571(2) | 23,885,055 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ට වැඩි තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.67,221,862 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,894,172 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු '000. | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 24,733 | 24,185 | 7,949 | 95,561 | 21,486 | 24,288 | 7,053 | 87,831 |
| (ii) කුලී | 55,017 | 39,048 | 36,254 | 30,896 | 29,426 | 38,063 | 31,524 | 31,412 |
| (iii) බලපත්‍ර ගාස්තු | 910 | 1,032 | 1,032 | - | 2,050 | 917 | 917 | - |
| (iv) වෙනත් ආදායම් | 91,628 | 112,592 | 76,504 | 150,438 | 122,042 | 76,124 | 68,515 | 85,710 |

සටහන:-සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායමෙන් රැස්කළ ආදායම තුල පසුගිය වර්ෂවල හිඟ ආදායම්වලින් එකතුකල ආදායම්ද ඇතුලත් වේ.

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

---

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම් රු.176,857,000 කින් සහ ඉකුත් වර්ෂවල හිඟ ආදායම් රු.204,953,000 කින් සමාලෝචිත වර්ෂයේදී රු.121,739,000 ක් රැස්කරගෙන තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට රු.204,953,000 ක් වූ හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසානයට රු.276,895,000 ක් වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

---

සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය හා වර්ෂයේ බිල්කිරීම්වලින් එකතුව රු.112,016,000 ක් අයකර ගතයුතු වුවද රු.7,949,000 ක් පමණක් වර්ෂය තුල අයකරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ රු.95,560,708 ක් වූයෙන් ආදායම් රැස්කිරීම දුර්වල තත්ත්වයක පැවතුණි.

2.2.4 කුලී

---

සභාව සතු දේපළ බදු දීමෙන් 2009 වර්ෂයට පෙර සිට අයවිය යුතු කුලී රු.19,453,493 ක් පිළිබඳ විස්තරාත්මක තොරතුරු සභාව සතු ලේඛනවලින් සනාථ නොවීම හේතුවෙන් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

2.2.5 බලපත්‍ර ගාස්තු

---

වෙළඳ බලපත්‍ර ස්ථාන පිළිබඳව 2017 වර්ෂයේ සිදුකර තිබුණු ක්ෂේත්‍ර සමීක්ෂණ වාර්තාව හා වෙළඳ බලපත්‍ර ගාස්තු ලේඛනය පරීක්ෂාවේදී ව්‍යාපාරික ස්ථාන 197 කට අදාලව රු.365,000 ක් බිල්කර නොතිබුණි.

2.2.6 වෙනත් ආදායම්

---

නගර සභා බල ප්‍රදේශයේ සවිකර තිබුණු දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණය කර දැන්වීම් පුවරු ලේඛනයක් පිළියෙල කිරීම සහ හිඟ ගාස්තු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

2.2.7 මුද්දර ගාස්තු

---

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති රු.17,806,505 ක් වූ මුද්දර ගාස්තු වලින් 2013 – 2017 කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු.2,998,207 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කාර්යසාධනය

------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණ පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

-------------------

නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 15ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිට අතුරු ව්‍යවස්ථා කිසිවක් පනවා නොතිබුණු අතර, පළාත් සභාව විසින් පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා සභාව වැළඳ ගෙන තිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැළැස්ම**

----------------------

සභාව වැළඳගෙන තිබූ සම්මත අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 17 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

-----------------------------------------------

සංවර්ධන සැළැස්මේ වූ විවිධ කර්තව්‍යයන් 18 ක් ඉටු කිරීම සඳහා රු.11,915,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි.

**(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතුවල නිරත කාර්යය මණ්ඩලයේ 10 දෙනාට වර්ෂයකට රු.ලක්ෂ 38 ක් පමණ වැටුප් වශයෙන් ගෙවා තිබුණු අතර, දිනකට එකතු කරන කසළ ට්‍රැක්ටර් 17 කින් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට ට්‍රැක්ටර් 04 ක් පමණ ලබාගෙන තිබුණි. ඉතිරි කසළ කොම්පෝස්ට් අංගනය අසළ විවෘතව ඉඩමකට මුදා හරිමින් පැවතුණි.

(ii) සභා බල ප්‍රදේශය තුල කසළ වෙන්කර (වර්ගීකරණය කර) ලබාගෙන නොතිබුණු අතර කොම්පෝස්ට් අංගනය තුල එම කසළ වෙන්කිරීම කම්කරුවන් විසින් සිදු කරමින් පැවතුණි.

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

---------------------------

සභාව විසින් "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" යටතේ දිළිඳුබව අවම කිරීම, පරිසර ආරක්ෂණ වැඩ සටහන්, ආබාධිත පුද්ගලයන් සවිබල ගැන්වීම සහ ප්‍රජා සමගිය ඇතිකිරීම වශයෙන් වූ අරමුණු සමග ඉලක්ක හඳුනාගෙන තිබුණි. තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන තිබුණද එම පාර්ශව දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කොළඹ පුත්තලම ප්‍රධාන මාර්ගයේ සභාවට අයත් කඩ කාමර දෙකක් සම්බන්ධ බදු ගිවිසුමට පටහැනිව බදුකරු විසින් මාර්ග රක්ෂිතයද උපයෝගී කරගෙන බිම් මහල සමග තවත් මහල් 03 ක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණු අතර, ගිවිසුම් ප්‍රකාරව හා නගර සභා ආඥා පනතේ (255 අධිකාරයේ) 84(1) වගන්තිය ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) කොහු නිෂ්පාදන ව්‍යාපෘතියකට අයත් රු.3,668,606 ක්වූ දේපළ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2014 ජූනි 03 දින සභාවට පවරා දී තිබුණි. මෙම දේපළවලින් කිසිදු ආදායමක් ඉපයීමට සභාව කටයුතු කර නොතිබුණු අතර දේපළේ ආරක්ෂාව සම්බන්ධයෙන්ද කිසිදු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබූ බැවින් යන්ත්‍රවලට සවිකර තිබූ විදුලි මෝටර් 06 ක් සොරුන් විසින් ගලවාගෙන ගොස් තිබුණි.

(ඇ) සභාවේ වැඩ හා සෞඛ්‍ය අංශයේ 130 ක් පමණ කාර්යය මණ්ඩලයක් සේවයේ නිරතව සිටියද, ඔවුන්ගේ පැමිණීම/පිටවීම පිළිබඳ විධිමත් බව තහවුරු කර ගැනීම සඳහා වේලා සටහන් යන්ත්‍ර සවිකර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ විධායක, ද්විතීයික, තෘතීයික හා ප්‍රාථමික තනතුරුවල පිළිවෙලින් 02,32,03 හා 01 ක පුරප්පාඩු තිබූ අතර ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවුන තනතුරු 04 ක අතිරික්තයක් පැවතුණි.

**(ආ) සේවක ණය**

--------------

ස්ථාන මාරු වී හෝ විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් ලැබිය යුතු රු.227,613 ක ශේෂය අයවිය යුතු පාර්ශව හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

සභාව සතු කැබ් රථ 02, ට්‍රැක්ටර් 02, බැකෝ ලෝඩරය, ගලිබවුසරය, වතුර බවුසරය හා බවුසර් ටේලරය පිළිබඳ විස්තර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි.

**3.4.2 පවරා නොගත් වත්කම්**

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් සහ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු වාහන 04 ක අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි.

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැළැස්ම**

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය අනුව සභාව විසින් ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කොම්පෝස්ට් ව්‍යාපෘති ගොඩනැගිල්ල ඉදිකිරීමේ පළමු අදියර ගෙවීම් වාර්තාවේ වැඩ විෂයයන් 05 කට අදාලව එකතුව රු.148,334 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) පුත්තලම හාමීන් පාර කොන්ක්‍රීට් ඇතිරීමේදී මීටර් 122.5 කට ගෙවීම් කර තිබුණද එය මීටර් 119.9 ක් වූයෙන් රු.28,650 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) පුත්තලම පොලීසිය පාර 03 පටුමග කොන්ක්‍රීට් ඇතිරීමේදී දිග මීටර් 02 ක් අඩුවෙන් නිමකිරීම මත රු.29,690 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) පිට වටරවුම් පාර 06 වන පටුමග කාණුව ඉදිකිරීමේ කර්මාන්තයේ නිමැවුම අසතුටුදායක බැවින් රු.345,650 ක් වූ ගෙවීම් නවතා තිබුණි. සභාවේ වැඩ අධිකාරීවරයෙකු හා කාර්මික නිලධාරීන් දෙදෙනෙකු සභාවේ සේවය කළද මෙම කර්මාන්තය සම්බන්ධයෙන් කිසිදු අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 38 ක රු11,095,000 ක්වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී හෝ වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

සභාව 2017 වර්ෂයට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ණයගැති/ණයහිමි පාලනය | (i) හඳුනා නොගත් පැරණි ණය ශේෂ පිළිබඳව කටයුතු නොකිරීම<br>(ii) පාලන ගිණුම් පවත්වා නොගැනීම |
| (ආ) | වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබීම<br>(ii) සමහර වත්කම් ගිණුම්ගත නොකිරීම<br>(iii) ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවර නොගැනීම |
| (ඇ) | සේවක කළමනාකරණය | (i) පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම<br>(ii) සේවක ණය ශේෂ පිළිබඳව කටයුතු නොකිරීම |
| (ඇ) | ආදායම් පාලනය | වරිපනම්, කඩ කුලී එකතු කිරීම දුර්වල තත්ත්වයක පැවතීම |